


ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
ஸ்ரீ லங்கா பொதுஜன பெரமுன
Sri Lanka Podujana Peramuna


# විශේෂ ප්‍රකාශයයි

ශ්‍රී ලංකාව තුළ මේ වන විට ඇතිවී තිබෙන විශේෂිත දේශපාලන සහ සමාජ තත්වයන් හමුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි නිල මතය සහ ස්ථාවරය සහිත සය වැදෑරුම් ප්‍රකාශනය ගෞරවයෙන් මෙසේ ඉදිරිපත් කරන්නෙමු.

1. අතිගරු ජනාධිපතිතුමන් සිය ධුරයෙන් ඉල්ලා අස්වීමේ ප්‍රමුඛ අභිලාෂය වන්නේ 2022 ජුලි 9 වනදා පැවති පක්ෂ නායක රැස්වීමේදී ද තීරණය කළ පරිදි සර්ව පාක්ෂික ආණ්ඩුවක් ස්ථාපිත කිරීම සඳහා අවකාශ සැලසීමයි. වර්තමාන පාර්ලිමේන්තුවේ බහුතර බලය හිමි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ අභිනව ජනාධිපතිවරයෙකු තෝරා පත්කර ගැනීම සඳහා වන පාර්ලිමේන්තු (අභ්‍යන්තර) ඡන්ද විමසීමට අපේක්ෂකයෙකු නම් කලහොත් එය පෙර සඳහන් අපේක්ෂාව හා ගැටෙන බැවින් අභිනව ජනාධිපතිවරයෙකු තෝරා ගැනීමේ ඡන්දයට අපේක්ෂකයෙකු ඉදිරිපත් නොකිරීම අප පක්ෂයේ තීරණයයි.

2. එලෙස ව්‍යවස්ථානුකූලව ස්ථාපිත වන අභිනව සර්ව පාක්ෂික ආණ්ඩුව සඳහා අරගලකරුවන්ගේ පාර්ශවයට ද සක්‍රීය ලෙස සහභාගී විය හැකි වන පරිදි විධිමත් නිල අවස්ථාවක් නිර්මාණය කිරීම ඉතා වැදගත් වන බැවින් එකී සෘජු සහභාගීත්වය සඳහා නිත්‍යානුකූල පිවිසුම් මඟක් කඩිනමින් නිර්මාණය කළ යුතු බව අපගේ යෝජනාවයි.

3. නව රජය ස්ථාපිත වූ මොහොතේ සිට සියල්ලන්ගේම යහපත වෙනුවෙන් රට තුළ නීතිය හා සාමය අකුරට ක්‍රියාත්මක වීමත්, නීත්‍යානුකූල ආයතන පද්ධති සහ ආයතනික ක්‍රියාවලීන් විධිමත්ව ක්‍රියාවට නැංවීමත්, එමෙන්ම වෙනස් කොට සැලකීමේ පීඩාකාරී තත්වයන්ට ගොදුරුවීමකින් තොරව (without discrimination) ජීවත් වීමට සහ තම කටයුතු පවත්වාගෙන යාමට රටේ සියලු පුරවැසියන්ට නිදහස් අවකාශ සැලසීමත් අත්‍යවශ්‍ය ප්‍රමුඛ කාර්යයක් වන බැවින් ඒ උදෙසා අපගේ කාරුණික ඉල්ලීම වන්නේ ගරුතර මහා සංඝරත්නය ප්‍රමුඛව සියලු ආගමික පූජක උතුමන්ලාත්, සියලු සිවිල් හා වෘත්තීය සංවිධාන ද ඇතුළු සමාජ නායකයිනුත් ඒ වෙනුවෙන් අවංකව සක්‍රීය ලෙස මැදිහත් විය යුතු බවයි. දැනටමත් එවැනි මැදිහත් වීමකට අදාලව මූලාරම්භයක් අපගේ නිරීක්ෂණයට ලක්වූ අතර ඒ පිළිබඳව අපගේ ප්‍රසාදය පලකර සිටින්නෙමු.


නො.1316, නෙළුම් මාවත, ජයන්තිපුර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. දුරකතනඃ +94 11 2866007
No. 1316, Nelum Mawatha, Jayanthipura, Battaramulla, Sri Lanka. Tel: + 94 11 2866007
Email: info@slpp.org.lk

4. ලොව පැරණිම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් සේම දීර්ඝ කාලයක් තිස්සේ දේශපාලන ප්‍රචණ්ඩක්‍රියා වලින් තොර රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාවට හිමිව තිබූ ප්‍රතිරූපය සහ කීර්තිනාමය අවිච්ඡින්නව පවත්වාගෙන යාම අප සියල්ලන් සතු අත්හළ නොහැකි වගකීමකි. ඒ උදෙසා සියලු දේශපාලන ව්‍යාපාරයන්ට සහ ඒවායෙහි ක්‍රියාකාරීන්ට ස්වකීය දේශපාලන කටයුතු නිදහසේ කරගෙන යා හැකි වන පරිදි නිදහස් සහ සාමකාමී දේශපාලන වාතාවරණයක් කඩිනමින් ස්ථාපිත විය යුතුය.

5. රට හමුවේ පවතින මූලික ආර්ථික අර්බුද විසඳමින් මහජනතාගේ දෛනික ජන ජීවිතය හා බැඳුණු දුෂ්කරතාවයන් සමනය කිරීම උදෙසා මූලික ප්‍රමුඛතාව ලබාදිය යුතු අතරම ගොවීන්, ධීවරයින්, කම්කරුවන්, ව්‍යාපාරිකයන්, වෘත්තිකයන් ඇතුළු සමස්ත වැඩකරන ජනතාවටත්, අධ්‍යාපන කටයුතුවල නිරතවන තරුණ දරුවන්, අඩු ආදායම්ලාභීන්, රැකියා සහ ආදායම් අහිමි වූවන්, ගෘහණියන්, ගැබිණි මව්වරුන් සහ විශේෂ අවධානයක් යොමුවිය යුතු අනෙකුත් සියලු පාර්ශව වෙත පවතින ආර්ථික තත්වයන්ට ගැළපෙන ආර්ථික සහනයක් කඩිනමින් ලබාදීම සහ තරුණ ප්‍රජාව වෙනුවෙන් නව ආර්ථිකමය අවස්ථාවන් කඩිනමින් නිර්මාණය කළ යුතුය.

6. ලෝක දේශපාලනය තුළ ශ්‍රී ලංකාව විසින් අඛණ්ඩව අනුගමනය කළ ඓතිහාසික නොබැඳි පිළිවෙත අනුව යමින් සියලු ජාත්‍යන්තර සබඳතා ඉතා ප්‍රශස්ත ලෙස පවත්වා ගෙන යාම සහ කිසිදු බාහිර පාර්ශවයකට ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ස්වාධීනත්වයට සෘජුව හෝ වක්‍රව බලපෑම් කළ නොහැකි වන පරිදි රාජතාන්ත්‍රික දේශපාලන තත්වයන් කළමණාකරණය කර ගත යුතුය.

නෙලුම් මාවත පක්ෂ මූලස්ථානයේදී.....
2022.07.14